CA | THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

08204 - ගිණුම්කරණ භාවිතය සහ බදුකරණය

ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - II
2012 සැප්තැම්බර්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

NOT FOR SALE

හිමිකම් ඇවිරිණි.

ප්‍රශ්න අංක 01

(අ) අත්පත් කරගැනීම මත පැන නගින කීර්තිනාමය

			රු'000
ආයෝජනය			10,000
පාලන - අයිතිය නොමැති හිමිකම්වල වෙළඳ අගය :			
කොටසක වෙළඳ අගය	රු.	25.00	
පාලනය නොමැති කොටස්		100,000	2,500
			12,500
ශුද්ධ වත්කම්			
ප්‍රකාශකළ ප්‍රාග්ධනය		4,000	
සාධාරණ වටිනාකමේ වැඩිවීම		1,200	
රඳවාගත් ඉපැයීම්		4,500	
			(9,700)
			2,800

(ලකුණු 03)

(ආ)

ඩයමන්ඩ් පීඑල්සී සමූහය
2012 මාර්තු 31 න් අවසන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	ඩයමන්ඩ්	ජෙම්	ගැලපීම්	රු'000
ආදායම	32,400	18,900	- විකුණුම් ආපසු 400 - සමාගම් අතර විකුණුම් 550	50,350
විකුණුම් පිරිවැය	23,640	14,680	- විකුණුම් පිරිවැය 320 - සමාගම් අතර විකුණුම් 550 + විකුණුම් මත උපලබ්ධි නොවූ ලාභ 25	(37,475)
දළ ලාභය				12,875
වෙනත් ආදායම්	1,580	300	- වාහන විකුණුම් ලාභ 120 - සමාගම් අතර පොලී 60 - ලාභාංශ 900	800
බෙදාහැරීමේ වියදම්	1,220	590	- වාහන අධි ක්ෂය 15	(1,795)
පරිපාලන වියදම්	1,800	1,250	+ ගොඩනැගිල ක්ෂය 10 + අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය 135	(3,195)
මූල්‍ය වියදම්	420	135	- අන්තර් සමාගම් පොලී 60	(495)
කීර්තිනාමය හාණිකරණය				(250)
බදුවලට පෙර ලාභය				7,940
ආදායම් බදු වියදම	1,600	750		(2,350)
වර්ෂය සඳහා ලාභය				5,590
මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට අදාල ලාභය				5,266
පාලනය නොමැති හිමිකම් වලට අදාල ලාභය			(පෙරවැඩ - 1 බලන්න)	324
				5,590

(ලකුණු 11)

NOT FOR SALE

(ඇ) **<u>ඩයමන්ඩ් පීඑල්සී සමූහය</u>**

<u>2012 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය</u>

<u>රු'000</u>

	ඩයමන්ඩ්	පෙම්	ගැලපීම්	
<u>වත්කම්</u>				
දේපල, පිරියත සහ උපකරණ	8,900	5,850	+ සාධාරණ අගය වැඩිවීම 1,200 - ඒ මත ක්ෂය : 10 [(1200 'x 1/3)/ වර්ෂ 40 - වාහන විකුණුම් ලාභ 120 + ඒ මත අධි ක්ෂය 15[120 x 25% x මාස 6]	15,835
කීර්තිනාමය	2,800		- හාණිකරනය 250	2,550
බඩු තොග	4,275	4,000	+ විකුණුම් ආපසු එවුම් 320 - උපලබ්ධි නොවූ ලාභ 25	8,570
අත ඉතිරි හා බැංකුවේ මුදල්	1,250	185		1,435
				28,390
<u>ස්කන්ධය සහ වගකීම්</u>				
ප්‍රකාශකළ ප්‍රාග්ධනය				6,000
ප්‍රත්‍යාගණන සංචිතය				4,000
ඒකාබද්ධ අයභාර සංචිත (පෙරවැඩ - 1 බලන්න)				14,704
පාලන හිමිකම් නොමැති අයිතිය (පෙරවැඩ - 2 බලන්න)				2,586
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් ණය				1,100
				28,390

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

NOT FOR SALE

<u>පෙර වැඩ 1</u>

රු'000

	ඩයමන්ඩ්	ජෙම්	
දී ඇති බදු අඩුකළ ලාභය	5,300	1,795	
ගොඩනැගිලි මත අමතර ක්ෂය (1200 x 1/3) x 1/40		(10)	
විකුණුම් ආපසු එවුම්		(400)	
එහි පිරිවැය		320	
උපලබ්ධි නොවූ ලාභ (250* 50% *25/125)		(25)	
අමතර ක්ෂය අඩුකර 120- (120*25% *6 මාස)	(105)		
අධ්‍යක්ෂ පාරිශ්‍රමික (450 * 1/3)		(135)	
සමාගම් අතර ලාභාංශ	(900)		
කීර්තිනාමය හාණිකරණය	(250)		
	4,045	**1,545**	**5,590**
පාලනය නොමැති හිමිකම් 25%		(386)	(386)
			5,204
රඳවාගත් ලාභ ඉ/ගෙ			12,500
ලාභාංශ			(3,000)
2012 මාර්තු 31දිනට ඒකාබද්ධ අයහාර සංචිත			14,704

<u>පෙර වැඩ 2</u>

2012 මාර්තු 31 දිනට පාලනය නොමැති හිමිකම් : රු'000

2011.04.01 දිනට වෙළඳ අගය	2,500
පා.නො. හි සඳහා වර්ෂයට අදාල ලාභය	386
ලාභාංශ (1200* 25%)	(300)
	2,586

NOT FOR SALE

<u>ප්‍රශ්න අංක 02</u>

(අ)

<u>රේන්බෝ පීඑල්සී</u>

<u>2012 මාර්තු 31 න් අවසන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය</u>

		රු'000
විකුණුම්		32,480
විකුණුම් පිරිවැය	(+ මගහැර්මි 140)	(19,460)
දළ ලාභය		13,020
වෙනත් ආදායම්	(- මුදල් ලැබීම 2,975 + ගොඩනැගිලි විකිණීමෙන් ලද ලාභය 55)	85
පරිපාලන වියදම්	(+ ගොඩ. ක්ෂය 61+ දේපල,පිරියත හා උපකරණ ක්ෂය 300 + පරිඝණක ක්ෂය 476 +මෝටර් රථ ක්ෂය 90 - කුලී තැන්පතු 10)	(3,352)
බෙදාහැර්මේ වියදම්	(අලාභ 150 + මෝටර් රථ ක්ෂය 990 + වෙබ් පිරිවැය 425 - බොල්ණය ගැලපීම් (325-80))	(2,672)
මූල්‍ය වියදම්	(+ කල් බදු පොලී 25)	(130)
බදුවලට පෙර ලාභ		6,951
ආදායම් බදු වියදම	(ජ. වර්ෂය 1940 + ඌනප්‍රගි. 40)	(1,980)
වර්ෂය සඳහා ලාභය		4,971
වෙනත් විස්තීර්ණ ආදායම්		
ප්‍රත්‍යගණන ලාභ		2,891
වර්ෂය සඳහා විස්තීර්ණ ලාභය		**7,862**

(ලකුණු 12)

NOT FOR SALE

(ආ) රේන්බෝ පීඑල්සී

2012 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		රු'000
ජංගම නොවන වත්කම්		
දේපළ, පිරියත සහ උපකරණ		12,614
අස්පෘශ්‍ය වත්කම්		-
ජංගම වත්කම්		
තොග		5,230
ලැබිය යුතු වෙළඳ ණය		6,275
අඩමාන ණය වෙන්කිරීම		(575)
අත්තිකාරම් හා පෙරගෙවීම්	(- පරිගණක අත් 240)	135
ගෙවල් කුලී අත්තිකාරම්		10
		23,689
ස්කන්ධය සහ වගකීම් ප්‍රාග්ධනය සහ සංචිත		
ප්‍රකාශිත ප්‍රාග්ධනය		4,000
ප්‍රත්‍යාගණන සංචිතය	(වර්.අති. 2,891 - මාරු කිරීම් 723)	2,168
රඳවාගත් ඉපයීම්	(5,207 + ජ.ව.ලාභ 4971+ ප්‍ර.සං.මාරු 723)	10,901
ජංගම නොවන වත්කම්		
කල්බදු		111
ජංගම වගකීම්		
වෙළඳ ණය	(+ සටහන් නොවීම් 140)	4,720
කල්බද්දේ ජංගම කොටස	(15.75* 12 - අවි.පොලී 20)	169
ගෙවිය යුතු ආදායම් බදු		1,480
බැංකු අයිරාව		140
		23,689

(ලකුණු 09)

(ඇ) දේපළ, පිරියත සහ උපකරණ සංචලනයන් පෙන්වන ප්‍රකාශනය **රු'000**

	ඉඩම් සහ ගොඩනැගිලි	පිරියත සහ යන්ත්‍ර	කල්බදු යන්ත්‍ර	පරිගණක උපකරණ	මෝටර් රථ
පිරිවැය /අගය කිරීම					
ශේෂය ඉ/ගෙ	9,700	1,900	500	1,050	5,250
එකතුකිරීම්				1,140	
ප්‍රත්‍යාගණනය මත ක්ෂය මාරු කිරීම්	(891)				
ප්‍රත්‍යාගණනය මත ගැලපීම්	2,891				
ඉවත්කිරීම්	(2,925)				(1,200)
ශේෂය ප/ගෙ	8,775	1,900	500	2,190	4,050
සමුච්චය ක්ෂය					

NOT FOR SALE

ශේෂය ඉ/ගෙ	850	925	125	480	2,450
වර්ෂය සඳහා අයකිරීම්	41 20	238	62	476	990
ඉවත්කිරීම් මත	(5)				(960)
ප්‍රත්‍යාගණන මත ක්ෂය මාරු කිරීම්	(891)				
ශේෂය ප/ගෙ	15	1,163	187	956	2,480
ශුද්ධ පොත් අගය	8,760	737	313	1,234	1,570

12,614 (ලකුණු 04)

පෙරවැඩ

ඉවත්කිරීම්	ගොඩනැගිලි		මෝටර්රථ	
විකිණීමෙන් ලැබීම්		2,975		90
පිරිවැය	2,925		1,200	
සමුච්චය ක්ෂය	(5)	2,920	(960)	240
ලාභය		55		(150)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක 03

(අ) වත්කම් සඳහා මිණුම් කිරීමේ පදනම්,

ඓතිහාසික පිරිවැය :

වත්කම් හුවමාරු මුදල් හෝ මුදලට සමාන වටිනාකමට වාර්තා කරයි.
උදාහරණ ලෙස, ස්ථාවර වත්කමක්, මිලදී ගන්නා වේලාවේදී ගෙවූ / ගෙවිය යුතු මුදලට මිණුම් කරනු ලබයි.

ජංගම පිරිවැය :
එම හෝ සමාන වත්කමක් වර්තමානයේදී මිලදී ගන්නේ නම්, ගෙවන මුදල හෝ මුදලට සමාන ප්‍රමාණයකට වත්කම ගෙනයනු ලබයි. උදාහරණ ලෙස වත්කමේ මිලට දැඩි උද්ධමනය බලපානු ලබයි නම්, ජංගම පිරිවැය රක්ෂණ කාර්යයේදී භාවිතා කරයි.

උපලබ්ධි අගය :
වත්කමක් නිසි පරිදි විකුණා ලබාගත හැකි මුදල හෝ මුදලට සමාන වටිනාකමට වත්කම් ගෙනයැම. උදාහරණ ලෙස, තොග සාමාන්‍යයෙන් මිණුම් කරනුයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකමටය.

වර්තමාන අගය :
සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී අයිතමයෙන් ජනිත කළහැකි ශුද්ධ මුදල් ප්‍රවාහයේ වර්තමාන වට්ටම් කළ අගයට වත්කම් ගෙනයැම.

(ලකුණු 04)

NOT FOR SALE

(ආ) <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>

<u>මෙහෙයුම් කාර්යයන්</u>

ගැලපීම්

මෝටර් රථ ඉවත්කිරීම මත ලාභ	400,000
<u>ආයෝජන කාර්යයන්</u>	
මෝටර් රථ මිලට ගැනීම	(4,000,000)
මෝටර් රථ විකිණීමෙන් ලැබුණ මුදල	3,400,000
<u>මූල්‍ය කාර්යයන්</u>	
බැංකු ණය ලැබීම	4,000,000
බැංකු ණය ආපසු ගෙවීම	(1,200,000)
බැංකු ණය පොලී ගෙවීම	(510,000)

(ලකුණු 06)

(ඇ)

	රු'000	<u>ප්‍රාග්ධනය</u>	<u>හේතු</u>
පිරියතේ ඉන්වොයිසි මිල	2,500	ඔව්	මෙය ගැණුම් මිලයි
නැව් ගාස්තු සහ ප්‍රවාහන වියදම්	30	ඔව්	සෘජු පිරිවැයයි
තීරු බදු සහ වැට් බදු	375	125 ක් පමණි	ආපසු ලබාගත නොහැකි සෘජු බදු පමණ හෝ ප්‍රාග්ධනය කෙරේ.
ගනුදෙනුව නිම කිරීමට නියෝජිතට ගෙවූ ගාස්තුව	25	ඔව්	පිරියත මිලට ගැනීමට එය සෘජු පිරිවැයයි
සවිකිරීමේ වියදම්	135	ඔව්	අපේක්ෂිත පාවිච්චිය සඳහා පිරියත සවිකල යුතුය.
ඉංජිනේරු වැටුප	45	ඔව්	ඉංජිනේරු ආයතනයේ සේවකයෙකු වුවද අදාල කාලයේ ඔහුගේ සේවය පිරියත සවිකිරීමට භාවිතා කළහෙයින් මෙම මුදල ප්‍රාග්ධනය කළ යුතුය. ඇතුලතින් මෙම සේවය ලබාගැනීමට නොනැතිනම් , එමගින් ලබාගෙන පිරිවැයක් දැරීමට සිදුවෙයි.
සේවක පුහුණු පිරිවැය	15	නැත	සෘජු පිරිවැයක් නොවේ.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

NOT FOR SALE

බදුකරණය

පිළිතුරු අංක 04

2011/2012 තක්සේරු වර්ෂය සඳහා මානවඩු මහතා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම.

රු.

		නිදහස්	බද්දට යටත්
සේවා නියුක්ත ආදායම			1,800,000
වැටුප් 150,000 x 12			
රථවාහන දීමනාව 60,000 x 12 = 720,000 අඩුකළා : මාසිකව 50,000 බැගින් බදු නිදහස් = 600,000		600,000	120,000
ලැබුන ප්‍රසාද දීමනා - මුදල් පදනම මත			180,000
ප්‍රතිපූර්ණය කරන ලද දුරකථන බිල් 52,000 x 50%			26,000
නවාතැන් පහසුකම් වියදම් = 425 x 5 = 2,125 x 128 = 272,000 ගුවන් ගාස්තු බදු නිදහස් වේ - 74,000		272,000 74,000	
ප්‍රතිපූර්ණය කරන ලද වෛද්‍ය වියදම්			94,000
කුලී වටිනාකම			
වරිපනම් තක්සේරුව + වරිපනම් = 300,000 + 90,000 = 390,000 } වැඩි අගය සේවාදායක විසින් ගෙවන ලද කුලිය = 30000 x 12 = 360,000 අංක 4 (1) (ඒ) වගන්තිය යටතේ සේවා නියුක්ත ආදායම රුපි. 1,800,000 ට වැඩි නිසා ඉහත දෙකෙන් වැඩි අගය වන්නේ = 390,000 } අඩු අගය ව්‍යවස්ථාපිත සීමාව වන්නේ = 180,000 ඉහත වඩා අඩු අගය - සේවා දායක විසින් ගෙවූ කුලිය (180,000 - 9000 x 12) බද්දට යටත් වන්නේ රුපි. 72,000			72,000
සේවා නියුක්ත ආදායම			**2,292,000**
රුපි. 100000 ක් බදු නිදහස් වේ			(100,000)
සේවා නියුක්තියෙන් ව්‍යාවස්ථාපිත ආදායම			**2,192,000**
පොලී ආදායම			
ඕස්ට්‍රේලියාවේ බැංකු ගිණුමක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබ ඇති නිසා බැංකු ගිණුමක තැන්පත් කරන ලද මුදල සඳහා ලැබූ පොලී ආදායම බද්දෙන් නිදහස් වේ. අනේවාසික විදේශ මුදල් ගිණුම් සඳහා වන පොලී බද්දෙන් නිදහස් වේ.			
ව්‍යාපාර ආදායම			
ගිණුම් අනුව ශුද්ධ ලාභය	**1,590,000**		
අඩුකළා: වෙනත් මූලාශ්‍ර වලින් ලද ආදායම්			
කුලී ආදායම්	(1060,000)		
පරිගණක යන්ත්‍රය විකිණීමෙන් ලද ලාභය	(25,000)		
එකතු කළා / අඩු කළා ඉඩ නොදෙන අයිතමයන්			
ගොඩනැගිල්ලේ වරිපනම් 120,000 න් 2/3	80,000		
ගොඩනැගිලි අළුත් වැඩියා වියදම් - කුලියට දී ඇති කොටස සඳහා 450,000 න් 2/3	300,000		
රාජ්‍ය භාග	825,000		
නව පරිගණකය සඳහා පොත් අගයට - ක්ෂය කිරීම්	200,000		
ග්‍රැපික් පරිගණකය ඉවත් කිරීමෙන් ලාභය / අලාභය අලෙවියෙන් ලද මුදල = 25,000			
අඩු කලා - අත්පත් කර ගැනීමේ පිරිවැය = 356,000 අඩු කලා - ප්‍රධානය කර ඇති ප්‍රාග්ධන දීමනා =-267,000 89,000 බදු සඳහා අලාභය 64,000	(64,000)		

NOT FOR SALE

මේ නිසා අත්පත් කර ගැනීමේ පිරිවැය සඳහා ප්‍රාග්ධන දීමනා ලබාගත හැක. 400000 න් 25% බැගින් ප්‍රාග්ධන දීමනා	(100,000)		
ප්‍රචාරණ වියදම් 416,000 එයින් 25% ක් ඉඩ දෙනු නොලැබේ	104,000		
ගලපන ලද ලාභය	<u>1,850,000</u>		**1,850,000**
කුලී ආදායම			
ලැබුණ දල කුලිය 1,060,000 අඩුකළා : වරිපනම් (120000 x 2/3) <u>(80,000)</u> 980,000 අඩුකළා : 25% අළුත් වැඩියා දීමනාව <u>- 245,000</u> <u>735,000</u> ශුද්ධ වාර්ෂික වටිනාකම = වරිපනම් තක්සේරුව - අළුත් වැඩියා දීමනාව 400,000 - 100,000 = 300,000 300,000 න් 2/3 = 200,000 ශුද්ධ කුලී ආදායම වාර්ෂික වටිනාකමට වඩා වැඩිවේ.			735,000
පදිංචිකරුගේ ආදායම = ශුද්ධ වටිනාකම - පදිංචිකරු විසින් ගෙවූ කුලිය ශුද්ධ වාර්ෂික වටිනාකම = වරිපනම් තක්සේරුව - 25% අළුත්වැඩියා දීමනාව 180,000 - 45,000 = 135,000 ගෙවූ දල කුලිය = 60,000 පදිංචිකරුගේ ආදායම = 135,000- 60,000 = 75,000 අයිතිකරුගේ ආදායම = ශුද්ධ වාර්ෂික වටිනාකම - පදිංචිකරුගේ ආදායම 135,000 - 75,000 = 60,000			60,000
මුළු ව්‍යවස්ථාපිත ආදායම			**4,837,000**
අඩුකළා : අංක 32 වගන්ති යටතේ අඩුකිරීම් වෙනත් මූලාශ්‍ර වලින් ණය පොලී අඩු කිරීමට ප්‍රමාණවත් ආදායමක් ඇති නිසා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පිළිගත් පුද්ගලයෙකුගෙන් ලබාගත් ණය සඳහා ගෙවූ පොලී නිසා එට අඩු කල හැකිය.			58,000
ගෙවූ රාජ්‍ය භාග			650,000
තක්සේරුවන ආදායම			4,129,000
අඩුකළා : සුදුසුකම් ලබන ගෙවීම් : සේ.අ.අ.දායක මුදල් ගෙවීම සුදුසුකම් ලබන ගෙවීමක් නොවේ. රජයට කල පරිත්‍යාග 100% ක්ම අඩු කළ හැකිය. බැංකුවකින් ලබාගත් ණය මුදලක් නොවන නිසා ණය ආපසු ගෙවීම සුදුසුකම් ලබන ගෙවීමක් නොවේ.			46,000
බදු නිදහස් දීමනාව			500,000
බදුවන ආදායම			**3,583,000**
පළමු 500,000 4% බැගින් 20,000			
ඊළඟ 500,000 8% බැගින් 40,000			
ව්‍යාපාර ආදායම 1,850,000 උපරිම අනුපාතය 10% බැගින් 185,000			
ඊළඟ 50,0000 12% බැගින් 60,000			
ඉතිරිය 233,000 16 % බැගින් <u>37,280</u>			
ගෙවිය යුතු දළ ආදායම් බද්ද	342,280		
අඩුකළා : බදු බැර			
ස්වතක්සේරු යටතේ ගෙවීම්	250,000		
උ.වි. ගෙ.	132,800		
ආපසු ලබාගත හැකි වැඩි පුර ගෙවූ ආදායම් බදු	**40,520**		

NOT FOR SALE

(ව්‍යාපාර ආදායම් යටතේ) ගුදාක් පරිඝණකය ඉවත් කිරීම සඳහා වන විකල්ප පිළිතුර

සමහර විභාග අපේක්ෂකයින් ගුදාක් පරිඝණකය ඉවත් කිරීමෙන් වන බදු ගණනය කිරීමේදී පරිඝණකය විකුණන ලද වර්ෂය සඳහා ප්‍රාග්ධන දීමනා සැලකිල්ලට ගෙන තිබුණ විය හැකිය. එවැනි අවස්ථාවල බදු අලාභයක් තිබිය නොහැකි අතර නව පරිඝණකය ආදේශ කිරීමක් නිසා එය නව වත්කමට ප්‍රාග්ධන දීමනා ලබා ගැනීම සඳහා බලපානු ඇත. ඒ අනුව විකල්ප පිළිතුර පහත දී ඇත.

ගුදාක් පරිඝණකය ඉවත් කිරීමෙන් ලාභය / අලාභය	රු	රු
විකුණුම් මුදල		25,000
අඩුකළා : අත්පත් කරගැනීමේ පිරිවැය	356,000	
අඩුකළා : ඉඩ දී ඇති ප්‍රාග්ධන දීමනා	-356,000	0
බදු සඳහා වන ලාභය		25,000

අත්පත් කර ගැනීමේ පිරිවැයෙන් පරණ පරිඝණකය ඉවත් කිරීමෙන් ලැබුන ලාභය අඩුකර ඉතිරියට ප්‍රාග්ධන දීමනා ලබා දෙනු ඇත. ඒ අනුව ලබා ගත හැකි ප්‍රාග්ධන දීමනාව වන්නේ :

නව ගුදාක් පරිඝණකය (ආදේශ කිරීමේ පදනම මත) = 400,000- 25,000 = රු. 375,000
375,000 න් 25% = රු. 93,750

පරණ ගුදාක් පරිඝණකයට (2011/2012 තක්සේරු වර්ෂය සඳහා ක්ෂය)
=356,000 x 25% = රු. 89,000

විකල්ප පිළිතුර අනුව ව්‍යාපාරයෙන් ලැබූ ලාභය වන්නේ 1,831,250 , ලාභය රුපි. 187,750 කින් අඩු වී ඇත.

දැන් ගෙවිය යුතු බද්ද වන්නේ 187,750 x 10% = රු_1,875

දළ ආදායම් බදු බැඳියාව වනු ඇත්තේ = **රු_340,405 කි.**

(මුළු ලකුණු 25)

NOT FOR SALE

<u>පිළිතුරු අංක 05</u>

2011/2012 තක්සේරු වර්ෂය සඳහා සන්පැක් එන්ටර්ප්‍රයිසස් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය හා ගෙවිය යුතු හවුල් ව්‍යාපාර බද්ද ගණනය කිරීම.

	+ (රු.)	- (රු.)
ගිණුම් අනුව ශුද්ධ ලාභය	3,083,000	
අඩුකළා : අචල තැන්පතු සඳහා පොලී - රඳවා ගැනීමේ බදු අඩුකර ඇත.		540,000
එකතු කළා : <u>හවුල්කරුවන්ගේ වැටුප්</u> වසන්ත 600,000 සරත් 500,000 හේමන්ත <u>400,000</u>	1,500,000	
<u>පුහුණුව සඳහා වූ වියදම්</u> 142,000- 48,000 = 94,000 ඉඩදෙනු ලැබේ. ගුවන් ගාස්තු - පෙර තක්සේරු වර්ෂයේ ලාභයසහ ආදායමෙන් 2% හෝ සත්‍ය වියදම යන දෙකෙන් අඩු මුදල 3,456,000 x 2% - 70,920 මේ නිසා 48000/- අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.		
සංග්‍රහ වියදම් ඉඩදෙනු නොලැබේ	214,000	
පොත් අගයට ක්ෂය කිරීම - ගොඩනැගිලි	450,000	
ගොඩනැගිල්ල සඳහා ප්‍රාග්ධන දීමනා 45,00,000 x 6 2/3 % කාර්මික ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා යොදා ගෙන ඇති මෙම ගොඩනැගිල්ල වෙනත් හවුල් ව්‍යාපාරයකින් මිලදී ගෙන ඇත.		300,000
<u>කපා හල බොල් ණය</u>		
හවුල් කරුවකුට දුන් ණය මුදල	250,000	
සැපයුම් කරුවකුට දුන් ණය මුදල	150,000	
වෙළඳ ණය ගැතියෝ ඉඩ දෙනු ලැබේ		
හවුල්කරුවකුට ගෙවූ පොලිය ඉඩ දෙනු ලැබේ		
බෙදිය හැකි ලාභය / ගළපන ලද ලාභය	**4,807,000**	
හවුල් ව්‍යාපාර බද්ද (බෙදිය හැකි ලාභය + වෙනත් ආදායම්) - බදු නිදහස් දීමනාව (4,807,000 + 0) - 600,000- 4,207,000 හවුල් ව්‍යාපාර බද්ද = 4,207,000 ට 8% බැගින් = **336,560**		

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුරු අංක 06

(අ) දරුවකුගේ ආදායම පියාගේ ආදායමට එකතු කරනු ලබන්නේ :-

- පියා වාසික පුද්ගලයකු වී ද හා
- තක්සේරු වර්ෂය තුලදී දෙමාපියන්ගේ විවාහය පැවතීම හෝ
- තක්සේරු වර්ෂය තුලදී දෙමාපියන්ගේ විවාහය නොපවතින අතර දරුවා පියා විසින් නඩත්තු කිරීම හා පියා සමඟ ජීවත්වීම.
- තක්සේරු වර්ෂය තුලදී දෙමාපියන්ගේ විවාහය අවසන් වීම.

(ලකුණු 03)

(ආ) පහත අවස්ථාවලදී දෙමාපියන්ගේ විවාහය නොපවතින බව හගවනු ලැබේ.

- නිසි උසාවි නියෝගයක් යටතේ දෙමාපියන් එකිනෙකාගෙන් වෙන් වෙන්ව ජීවත්වන අවස්ථාවල
- නිසිලෙස ක්‍රියාත්මක කරන ලද වෙන්වීමේ ක්‍රියාවක් යටතේ දෙමාපියන් එකිනෙකාගෙන් වෙන් වෙන්ව ජීවත්වන අවස්ථාවල
- දෙමාපියන් එකිනෙකාගෙන් වෙන් වෙන්ව ජීවත්වන අවස්ථාවල හා එම වෙන්වී සිටීම ස්ථිර වෙන්වී සිටීමක් ලෙස දැකිය හැකි අවස්ථාවල

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

පිළිතුරු අංක 07

(අ) භාණ්ඩ යනුවෙන් අදහස් කරන්නේ :-

- මුදල් හා
- ගණුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතාවයන් ආදිය සඳහා නිපදවන ලද පරිඝණක මෘදුකාංග හැර අන් සියලුම ආකාරයේ චංචල හා නිශ්චල දේපලයි.

(ලකුණු 02)

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම්කිසි පුද්ගලයකුගේ ලියාපදිංචිය අවලංගු කළ විටෙක

(i) අවලංගු කළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි එවැනි පුද්ගලයකු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රදර්ශනය නොකළ යුතුය.

(ii) එවැනි පුද්ගලයකු විසින් නියමකරනු ලබන කාල සීමාව ඇතුලත දී ලියාපදිංචි කිරීමේ සහතිකය ආපසු යැවිය යුතුය.

(iii) එවැනි පුද්ගලයකු විසින් බදු ඉන්වොයිස්, බදු හරපත් හෝ බදු බැර පත් නිකුත් නොකළ යුතුය.

(iv) කවර හෝ භාණ්ඩ සේවාවන් බදු කාර්යනට අදාල වත්කම්වල කොටසක් වන්නේ නම් ඒවා අවලංගු දිනට පෙර සපයනු ලැබ ඇති බව සලකනු ලැබිය යුතුය.

(v) නමුත් එවැනි වත්කම් ද ඇතුලුව බදු කාර්යයන් වේ නම් එ.බදු සඳහා ලියාපදිංචි පුද්ගලයකු විසින් පවරා ගෙන ඇත්නම් මෙහි ඉහත අංක iv යටතේ දක්වා ඇති පුද්ගලයාට එ.බදු ගෙවීමේ වගකීමක් නැත.

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

NOT FOR SALE

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය ''එසේම'' යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු ''ආදර්ශ පිළිතුරු'' ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතින් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

NOT FOR SALE

---

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.